# යාපහුව ආශ්‍රිත ව හමුවන විවිධ සංස්කෘතික අවධීන්ට අයත් මැටි බඳුන්

**ටී.ඩී.සී. පුෂ්පකුමාර[1] හා බී.එච්.ඒ. රූපා[2]**

[1,2] පර්යේෂණ නිලධාරී (පුහුණුවන), වයඹ සංස්කෘතික චතුරශ්‍රය, යාපහුව ව්‍යාපෘතිය, යාපහුව
pushpakumara.tc@gmail.com

## හැඳින්වීම

යාපහුව ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ජනාවාස ව පැවති ස්ථානයක් වන අතර ඒ ආශ්‍රිත ව පූර්ව ඓතිහාසික යුගයේ දී හා ඉන්පසුව ඓතිහාසික යුගයේ දී අඛණ්ඩ ව මානව ක්‍රියාකාරකම් සිදු වූ බව සාහිත්‍ය මූලාශ්‍ර හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් සනාථ වේ (මහාවංශය 81 පරි. 1-8 ගාථා. දිසානායක 2005:15-29, ගවේෂණ 2001). පුරාවිද්‍යාත්මක සාධක අතුරින් මැටිබඳුන් ඉතා වැදගත් හා සුලභ සාධකයක් වන අතර එ සේ හමුවන මැටිබඳුන් කොටස් පූර්ව ඓතිහාසික යුගයේ සිට මහනුවර යුගය දක්වා විවිධ කාලසීමාවන්ට අයත් වන බව හඳුනාගත හැකි වේ. පූර්ව ඓතිහාසික යුගය. මුල් ආරාමික යුගය සම්බන්ධ ව මෙන් ම යාපහුව රාජධානි සමයේ දී පැවති විදේශ සම්බන්ධතා වැනි යාපහුවේ ඓතිහාසිකත්වය ගොඩනැගීමේ දී වැදගත්වන කරුණු රැසක් මැටිබඳුන් ආශ්‍රයෙන් අනාවරණය කරගැනීමට හැකි වේ. යාපහුවෙන් හමුවන මැටිබඳුන් වර්ග හා ඒවා නියෝජනය කරන විවිධ කාලසීමාවන් පිළිබඳ ව මූලික අධ්‍යයනයන් මගින් හඳුනාගත් කරුණු මෙම පත්‍රිකාව මගින් ඉදිරිපත් කරයි.

**යාපහුව ආශ්‍රිත ව හමුවන විවිධ කාලසීමාවන්ට අයත් මැටිබඳුන්**

යාපහුව ආශ්‍රිත කලාපයෙන් හමුවන පැරණි ම මැටිබඳුන් වශයෙන් පිංවැව ගල් සොහොන්කනත්තෙන් හමු වී ඇති කාලරක්ත මැටිබඳුන් හා රක්තවර්ණ මැටිබඳුන් හඳුනාගත හැකි ය (ලියනගේ 2006). පින්වැව සුසානයන්ගෙන් හමුවී ඇති කාලරක්තවර්ණ (BRW) මැටිබඳුන්වල හැඩයන්ට සමාන හැඩයන්ගෙන් යුත් මැටිබඳුන් ගැටි කොටස් යාපහුවෙන්ද හමුවන බැවින් ඒවා සුසාන භාවිත කළ කාලසීමාවට සමකාලීනදැයි යන්න පරීක්ෂාකර බැලීම වැදගත් ය (දිසානායක 2005). ඒ සඳහා මතුපිටින් බලා කරන විශ්ලේෂණයන්ගෙන් ඔබ්බට ගොස් හරස්කඩ විශ්ලේෂණයන් (thin section analise) වැනි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු ය. පිංවැව සුසාන ස්ථානය හා ඇඹෝගම වැවට මැදිවව පිහිටි කොටසින් ද රක්ත වර්ණ බඳුන් (Red ware) කොටස් රැසක් හමු වී ඇත. ඒවා සුසාන අයත් කාලසීමාවට වඩා පසුකාලීන ව භාවිත කළ මැටි බඳුන් වලට සමානකම් ඇතිබව හඳුනාගත හැකි ය. යාපහුවෙන් හා පිංවැව සුසානයෙන් හමුවන මැටි බඳුන් ඉතා සියුම්ව අධ්‍යයනය කිරීම තුළින් ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ පවතින සංක්‍රාන්තික ලක්ෂණ පිළිබඳ ව කලාපීයව පවතින තත්ත්වය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගත හැකිවනු ඇත.

යාපහුව පර්වතය ආශ්‍රිත ව ඇති ස්වාභාවික ලෙන් පද්ධතිය මුල්කරගෙන මුල් ම බෞද්ධ ආරාම පැවති කාලසීමාවේ දී භික්ෂූන් වහන්සේලා විසින් භාවිත කලායැයි සිතිය හැකි කාලවර්ණ පාත්‍ර කොටස් විශාල වශයෙන් ලෙන් ආශ්‍රිත ව මෙන් ම පර්වතය මුදුනෙහි හා තදාශ්‍රිත කලාපයෙන් හමු වේ. යාපහුවට ආසන්නයෙන් ඇති නාගොල්ල විහාරස්ථානයේ පැරණි ලෙනක් ආශ්‍රිතව ද කාලවර්ණ පාත්‍ර කොටස් හමු වී ඇති බැවින් නිශ්චිත ව මෙම කාලවර්ණ මැටිබඳුන් මුල්

ආරාමික යුගයේ දී මෙම කලාපය තුළ භාවිත වූ බව නිගමනය කළ හැකි ය.

ලංකාවේ බොහෝ ප්‍රදේශවල ක්‍රි.ව 1 වැනි සියවසයේ සිට ක්‍රි.ව 9 වැනි සියවස අතර කාලයේ දී භාවිත කළ පොදු මැටිබඳුන් වර්ග රැසක් යාපහුවෙන් හමුවන අතර එම බඳුන්වල හැඩය (Form) හා ගැටිවල හැඩයන් (Rim type) අධ්‍යයනය කරන විට ඒවායෙන් බොහෝමයක් බඳුන් වර්ග අනුරාධපුරයෙන් හමුවන මැටි බඳුන්වලට සමානකම් තිබෙන බව පැහැදිලි වේ. යාපහුවෙන් හමු වී ඇති මිනිරන් ආලේප කළ බඳුන් Graphite ware හා ඔප දමන ලද රක්තවර්ණ බඳුන් Red polish ware වලට සමාන බඳුන් අනුරාධපුර ජේතවනය පුරාවිද්‍යා භූමියෙන් හමු වී ඇත. ක්‍රි.ව මුල් සියවස්වල දී භාවිත කළ රූලේටඩ් (Roulated ware) හෝ ඒවා අයත් අළු පැහැති බඳුන් (Gray ware family) හා එම බඳුන් අනුකරණය කර සකස්කළ බඳුන් කොටස් ද හමුවෙයි. මේ තුළින් අනුරාධපුර රාජධානිය පැවති සමයේ දී ලංකාවේ නාගරික හා ආගමික ස්ථානවල භාවිත වූ මැටි බඳුන් වර්ග යාපහුවට ද විවිධ ප්‍රදේශවලින් රැගෙන එන්නට ඇති බව පැහැදිලි වේ.

සුභ සෙනවියා යාපහුවට පැමිණීමෙන් පසු බලකොටුවක් හා රාජධානියක් වශයෙන් දියුණු වීම දක්වා කාලසීමාව තුළ දී යාපහුව පර්වතය මත හා දූනට බලකොටුව වශයෙන් හඳුන්වන ප්‍රදේශය තුළ වැඩි වශයෙන් ඉදිකිරීම් හා මානව ක්‍රියාකාරකම් සිදු වී ඇති බවක් දක්නට ලැබේ. පර්වතය මත හා බලකොටුවේ ප්‍රාකාරවලින් ඇතුළ ප්‍රදේශයේ විවිධ වර්ගවලට අයත් දේශීය මටිබඳුන් හා විදේශීය බඳුන් වර්ග රැසක් හමු වී තිබේ. බොහෝමයක් දේශීය බඳුන් පොළොන්නරුවෙන් හමු වී ඇති මැටිබඳුන්වලට සමානකම් ඇති බැවින් ඒවා අවම වශයෙන් ක්‍රි.ව. 1215 සිට යාපහුව රාජධානියේ අවසානය දක්වා යාපහුව ආශ්‍රිත ව සිදුවූ ක්‍රියාකාරකම් පිළිබිඳ අවබෝධයක් ලබාගැනීමට වැදගත් වේ.

යාපහුවෙන් මුල් වරට 1949 දී චීන මැටි බඳුන් කිහිපයක් හමු වී තිබේ (ASCAR, 1950:23-24). වයඹ සංස්කෘතික චතුරශ්‍රය මීගින් බංගලාපිටිය නමින් හැඳින්වෙන දිය අගලෙන් පිටත කොටසේ හා දිය අගලෙහි සිදුකළ කැනීම් මීගින් හා පර්වත මස්තකයෙහි සිදුකළ ගවේෂණවල දී චීනයේ විවිධ ප්‍රදේශවල නිෂ්පාදිත බඳුන් වර්ග කිහිපයකයට අයත් කොටස් හමු වී ඇත. මෙම බඳුන් පරික්ෂා කරන විට චීනයේ දකුණු ත්සුං පාලනය පැවති යුගයේ දී භාවිත කළ සෙලිඩොන් හා සුදු පැහැති ග්ලේස් කරන ලද බඳුන් වැඩි ප්‍රමාණයක් වන බව පැහැදිලි වේ. ඒ අනුව එම බඳුන් යාපහුව රාජධානිය හා චීනය සමග පැවති සෘජු සබඳතා තහවුරු කරන ඉතා වැදගත් සාක්ෂි වශයෙන් හඳුනාගත හැකි වේ. එම බඳුන් අතරින් ලොන්ක්වාන් සෙලිඩොන් Longquan celadone, උතුරු චීනයේ ග්ලේස් කරන ලද මැටි බඳුන් North Chinese glazed ware, දොහ්වා සුදු පැහැති බඳුන් Dehua white ware වැඩි වශයෙන් හමුවන බඳුන් වර්ග වේ.

කන්ද උඩරට රාජධානිය ව පැවති කාලසීමාවේ දී භාවිත කළ කැටයම් එබ්බ වූ මැටි බඳුන් (Pre firing embossed decorated) කොටස් හා එම කාලසීමාවේදී බහුල ව ව්‍යාප්ත වී තිබූ කෙම් සහිත බඳුන්වල කොටස් ලංකාවේ විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති අතර විශේෂයෙන් එම කාලසීමාවේදී දියුණුවූ විහාරාරාම ආශිතව මෙම බඳුන්වර්ග සුළභ වේ. යාපහුවෙන් හමුවන කැටයම් සහිත මැටිබඳුන් කොටස් හා කෙම් කොටස්වල නිදර්ශකයන් මහනුවර ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර තිබෙන බඳුන් හා විශාල වශයෙන් සමානකම් තිබේ (Silva and Disanayake 2005 276-280).

**සමාලෝචනය**

යාපහුවෙන් හමුවන මැටිබඳුන් සියුම්ව පරික්ෂා කිරිමේ දී ක්‍රි.පූ. 3 සියවසයේ සිට ක්‍රි.ව. 19 වන සියවස දක්වා විවිධ කාලසීමාවන්ට අයත් වන බව හඳුනාගත හැකි වේ. ලංකාවේ විවිධ ප්‍රදේශවල එක් එක් කාලසීමාවන් තුළ භාවිත කළ මැටි බඳුන් යාපහුව ආශ්‍රිත ව හමුවීම තුළින් යාපහුවේ සංස්කෘතික අවධි හඳුනාගැනීමේ දී මෙන්ම දේශීය හා විදේශීය වශයෙන් විවිධ ප්‍රදේශ සමිග පැවති සබඳතා හඳුනාගැනීමේ දී මැටිබඳුන් පුරාවිද්‍යාත්මක සාධකයක් වශයෙන් වැදගත්වන බව පෙන්වා දිය හැකි ය.

ආශ්‍රය ග්‍රන්ථ

දිසානායක සෙනරත් 2005, වයඹ පුත්‍ර ප්‍රසාදිනී මධ්‍යම සංස්කෘතික අරමුදල කොළඹ.
මහාවංශය. ☞ කොටස 1967 හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත සංස්කරණය මරදාන
යාපහුව 2001, (ගවේෂණ වාර්තාව) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ.
ලියනගේ. සමීරා. 2006, පිංවැව ගල්සොහොන් කනත්ත ගවේෂණය සහ කැණීම 1997 විද්‍යාපති නිබන්ධණය. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය. කැළණිය ශ්වවිද්‍යාලය.(අප්‍රකාශිත)
ASCAR 1950. Archaeological survey Department - Colombo.
De Silva and Dissanayake, 2008, A catalogue of ancient pottery from Sri Lanka PGIAR- Colombo.